# උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය
## (1987 අංක 50 දරණ පනත යටතේ සංස්ථාගත කරන ලද)
# පුරප්පාඩු

උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. <u>ආරක්ෂක සහකාර III ශ්‍රේණිය - (පුරප්පාඩු 15)</u>

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්:-**

**අධ්‍යාපන**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍යා සුදුසුකම්.

I. ඉහත ‘‘අ‘‘ සිට ‘‘ආ‘‘ දක්වා ඇති සුදුසුකම් හෝ ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ වසර 05 ක සතුටුදායක සේවය හෝ රජයේ / පුද්ගලික ආයතනයක වසර 05 ක් සේවය කර තිබිය යුතුය.

II. ශාරීරික සුදුසුකම් පිරිමි - උස 5’ 2” පපුව 32"

ගැහැණු - උස 5’

**අභ්‍යන්තර අයදුම්කරුවන්:-**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ‘‘ආ‘‘, ‘‘ඇ‘‘ සහ ‘‘ඉ‘‘ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් ඇරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවු.05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස :** අවු:18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** රු.27,910-10x300-7x350-12x600-12x710-49,080/=

**(ඉහත සඳහන් වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ)**

## 2. <u>කාර්මික ශිල්පී (ඉලෙක්ට්‍රොනික් /විදුලි) III ශ්‍රේණිය - (පුරප්පාඩු 02)</u>

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්:**

ශිල්පීය නිපුනතා

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- විදුලි කාර්මික (කර්මාන්ත ශිල්පී) විෂය ක්ෂේත්‍රය

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්,

හෝ

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- විදුලි කාර්මික (කර්මාන්ත ශිල්පී) විෂය ක්ෂේත්‍රය

**වයස:** අවු:18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය:** රු.26,290 – 10 x 270 – 10 x 300 – 10 x 330 – 12 x 350 - රු.39,490/=

**(ඉහත සඳහන් වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ)**

## 3. **<u>කාර්මික ශිල්පී (ගොඩනැගිලි/පෙදරේරු) III ශ්‍රේණිය</u>**(තනතුරු 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්:**

ශිල්පීය නිපුනතා

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- ඉදිකිරීම් කාර්මික (පෙදරේරු) විෂය ක්ෂේත්‍රය

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්,

හෝ

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

- ඉදිකිරීම් කාර්මික (පෙදෙරේරු) විෂය ක්ෂේත්‍රය

**වයස:** අවු:18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වැටුප් පරිමාණය:** රු.26,290 – 10 x 270 – 10 x 300 – 10 x 330 – 12 x 350 - රු.39,490/=

**(ඉහත සඳහන් වැටුපට අමතරව රජය විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ)**

**පොදු කොන්දේසි**

අ. සෑම ඉල්ලුම්කරුවෙක්ම

I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III විශිෂ්ය චරිතයෙන් යුක්ත විය යුතුය.

ආ. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර විශ්‍රාම වැටුප් රහිතය.ස්ථාන මාරුවීම් නොමැත.

ඇ. සියලු අයදුම්කරුවන් කළමනාකරණ මණ්ඩලය මගින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පසු තෝරා ගැනීම සිදු කෙරේ.

ඇ. සේ.අ.අ. සඳහා වැටුපෙන් 10% ක මුදලක් සේවා දායකයා විසින් ගෙවිය යුතු අතර, සේ.අ.අ. සඳහා 12% ක සහ සේ.නි.භා.අ. සඳහා 3% ක මුදලක් සේවායෝජකයා විසින් දායක මුදල් ලෙස ගෙවනු ලැබේ.

ඉ. තෝරා ගන්නා අයදුම්කරුවන්ට වෛද්‍ය, හදිසි අනතුරු රක්ෂණ පහසුකම් යනාදි ප්‍රතිලාභ හිමිවේ.

ඊ. ඉහත සුදුසුකම් සහ තනතුරට අදාළ පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා අයදුම්පත සමඟ එවිය යුතුය. (සහතිකපත් වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඉහත තොරතුරු ඇතුළත් අයදුම්කරු පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන් ඇතුළත් කරන ලද සම්පූර්ණ ජීව දත්ත සටහනක් ද සහිත අයදුම්පත් 2024.09.09 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

ප්‍රධාන විධායක නිලධාරී / මාර්ෂල්
උපරිමාධිකරණ සංකීර්ණය
තැ.පෙ.223,
කොළඹ 12.